# සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2024

Sri Lanka Cricket

01. ශ්‍රී ලංකා ක්‍රිකට් ප්‍රධාන විධායක නිලධාරී විසින් විදේශීය නිෂ්පාදකයින් හා ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්, දේශීය නිෂ්පාදකයින්, සේවා සපයන්නන්, සැපයුම්කරුවන්, සිවිල් ඉංජිනේරු කොන්ත්‍රාත්කරුවන් හා උපදේශකවරුන් යන භාණ්ඩ හා සේවාවන් සැපයුම්කරුවන්ගෙන් 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා ලියාපදිංචි වීමට මෙයින් ඇරයුම් කරනු ලැබේ.

## 02. අයදුම්පත් ලබා ගැනීම

***අ) දේශීය සැපයුම්කරුවන්***

කොළඹ 07, මේට්ලන්ඩ් පෙදෙස්, අංක 35 යන ස්ථානයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ක්‍රිකට් හී පරිපාලන අංශයෙන් අයදුම්පත් ලබා ගත හැකි අතර www.srilankacricket.lk යන වෙබ් අඩවියෙන්ද බාගත කර ගැනීමට හැක.

***ආ) විදේශීය සැපයුම්කරුවන්***

www.srilankacricket.lk යන වෙබ් අඩවියෙන්ද බාගත කර ගැනීමට හැක.

අයදුම්පත්‍ර කට්ටලය පහත සඳහන් අංග වලින් සමන්විත වේ.

1. ප්‍රධාන අයදුම්පත්‍රය 2. සාමාන්‍ය උපදෙස්, නියමයන් හා කොන්දේසි 3. සවිස්තරාත්මක භාණ්ඩ හා සේවා ලැයිස්තුව

## 04) ලැයිස්තුගත භාන්ඩ /සේවා කාණ්ඩයන් සඳහා ලියාපදිංචිවීමේ ගාස්තු ගෙවීම

අ) දේශීය සැපයුම්කරුවන් සෑම භාණ්ඩ හා සේවා කාණ්ඩයක් සඳහාම රුපියල් 6,000/= + බදු ගාස්තු (රුපියල් 7072.50) ගෙවිය යුතුවේ.

ආ) එක් එක් කාණ්ඩය සඳහා විදේශීය සැපයුම්කරුවන්ගෙන් (දේශීය නියෝජිතයෙකු නොමැති විට) ඇමරිකානු ඩොලර් 22 ($22) ක මුදලක් ගෙවිය යුතුවේ.

ඇ) වර්ෂ 2024 සඳහා භාණ්ඩ/ සේවා සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා ලිඛිත ඉල්ලීමක් කොළඹ 07, මේට්ලන්ඩ් පෙදෙසෙ හි පිහිටා ඇති ශ්‍රී ලංකා ක්‍රිකට් හී ගණකාධිකාරී වෙත යොමු කොට මුදල් මගින් හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් නමින් ලියවුණු ගෙවීම් නියෝගයක්/ බැංකු අණකරයක් මගින් හෝ ලංකා බැංකුවේ නිදහස් චතුරස්‍ර ශාඛාවේ ගිණුම් අංක 8353087 ට ගෙවිය හැක. මුදල් තැන්පත් කිරීමේ කුවිතාන්සිය අයදුම්පතට අමුණා තිබිය යුතුවේ. ගෙවීම් නියෝග/ බැංකු අණකර දින 90 ක් දක්වා වලංගු විය යුතුවේ. මුදල් ඇණවුම් බාරගනු නොලැබේ. එම ගෙවීම ශ්‍රී ලංකා ක්‍රිකට් ගිණුම වෙත අන්තර්ජාල ගෙවීම් ක්‍රමය ඔස්සේද සිදු කළ හැකි අතර, එසේ ගෙවීම් කිරීමෙන් පසු එය තහවුරු කිරීමට රිසිට් පතේ පැහැදිලි තිර පිටපතක් (Screenshot) අයදුම්පත සමග යොමු කළ යුතු වේ.

ඈ) විදේශීය සැපයුම්කරුවන් ස්විෆ්ට් කෝඩ් මගින් ලංකා බැංකුවට ගෙවීම් කළ යුතුවේ.

SWIFT කේතය - BCEYLKLX
ශාඛා කේතය - 453
ගිණුම් අංකය - 70898804

ඉ) සැපයුම් කාණ්ඩයන් සඳහා ගෙවනු ලැබූ මුදල් තැන්පතුවල ලදුපත් ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු වේ. (ලියාපදිංචිවීමේ කාණ්ඩවලට අදාලව ගෙවීම් සහතිකයක් ලෙස ඉදිරිපත් කළ යුතු වේ.)

ඊ) භාණ්ඩ /සේවා කාණ්ඩ සඳහා ලියාපදිංචි ගාස්තු දේශීය හා විදේශීය සැපයුම්කරුවන් ගෙවිය යුතු කාලය 2023 ඔක්තෝම්බර් 15 සිට නොවැම්බර් 30 දක්වා වේ. නොවැම්බර් 30 දිනට පසුව කරන ලද ගෙවීම් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් කිසිදු වගකීමක් දරණු නොලබන අතර එම ප්‍රමාදවී කරනු ලැබූ ගෙවීම් සඳහා ලියාපදිංචිය පිරිනමනු නොලැබේ.

5) සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ තැන්පතු ලදුපත් සමග කොළඹ 07, මේට්ලන්ඩ් පෙදෙසෙහි අංක 35, දරන ස්ථානයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ක්‍රිකට් හී පරිපාලන ප්‍රධානී වෙත ලියාපදිංචි තැපෑලෙන් 2023 නොවැම්බර් 30 දිනට හෝ ඉන්පෙර ලැබෙන සේ එවිය යුතුවේ.

අයදුම්පත් බහාලු ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවර දේශීය අයදුම්කරුවන් විසින් නම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම -2024 (දේශීය) යනුවෙනුත් විදේශීය අයදුම්කරුවන් විසින් නම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2024 (විදේශීය) යනුවෙනුත් සළකුණු කර තිබිය යුතුවේ.

6) 2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් /කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ අවසන් තීරණය ශ්‍රී ලංකා ක්‍රිකට් සතුවේ.

## 03) භාන්ඩ හා සේවා සැපයුම් ලැයිස්තුව

A. තොරතුරු තාක්ෂණ උපකරණ සහ සේවාවන් / ජංගම දුරකථන
B. කාර්යාලීය උපකරණ සහ ලිපි ද්‍රව්‍ය
C. සිහිවටනයන් / වෙළඳ භාණ්ඩ සහ සමරු ඵලක
D. සිවිල් ඉංජිනේරු අයිතමයන් සහ ද්‍රව්‍ය
E. රෙදිපිළි / පාවහන් /නිල ඇඳුම්
F. පොදු සැපයුම්
G. මෝටර් වාහන, යතුරුපැදි, ටයර්, ටියුබ් සහ බැටරි ආදිය
H. වෛද්‍ය උපකරණ සහ වෙළුම්පටි, ඖෂධ, විෂබීජ නාශක සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය
I. විදුලි උපකරණ, ආලෝකකරණ භාන්ඩ, විදුලි පහන් සහ උපාංග
J. වායු සමීකරණ, රූපවාහිනී සහ ගෘහ භාණ්ඩ
K. වීඩියෝ සහ ශ්‍රව්‍ය උපකරණ ඇතුලු උපාංග
L. සංනිවේදන සහ ඉලෙක්ට්‍රොනික උපාංග
M. කාර්යාලීය ගෘහ භාණ්ඩ, ප්ලාස්ටික්, යකඩ සහ තන්තු (Fiber) නිෂ්පාදන
N. ශක්තිජනකපාන සහ සිසිල් බීම
O. සූර්ය බලශක්ති පද්ධති, ජනක යන්ත්‍ර සහ ජල පොම්ප
P. ක්‍රිකට් ක්‍රීඩා උපකරණ සහ ද්‍රව්‍ය
Q. ක්‍රිකට් ක්‍රීඩාංගන උපකරණ සහ ද්‍රව්‍ය
R. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සහ ඉංජිනේරු සේවා
S. මුද්‍රණ කටයුතු
T. ආහාර හා බීම වර්ග සැපයීම
U. ක්‍රීඩාංගණ උපාංග
V. අළුත්වැඩියා, නඩත්තු කටයුතු සහ සේවා
W. සේවාවන්

පුද්ගලික ආරක්ෂක සේවා හා ආරක්ෂක උපකරණ/ සනීපාරක්ෂක සේවා/ ගිනි හා අකුණු ආරක්ෂණ/ රක්ෂණ/ දේශීය සහ විදේශීය කුරියර් සේවා/ නැව්/ගුවන් බඩු මුදවා ගැනීම හා බෙදාහැරීම/ කාර්, වෑන්, බස්, ලොරි, බූම් ට්‍රක්, ෆෝක්ලිෆ්ට් කුළියට සැපයීම්/ ගෘහ නිර්මාණ ශිල්පීන් සහ අභ්‍යන්තර නිර්මාණකරනය, ප්‍රමාණ සමීක්ෂණ සහ ව්‍යාපෘති කළමනාකරණ උපදේශකයින්/ ගුවන් ගමන්, වීසා සේවා/ හෝටල් නවාතැන් පහසුකම් වෙන්කරවා ගැනීම්/ ජනක යන්ත්‍ර හා වායු සමීකරණ කුලියට ගැනීම්/ මේස, පුටු කුළියට ගැනීම්, තාවකාලික මඩු, කැනපි ආදිය/ ලොන්ඩරි සේවා/ මහජන ඇමතුම් පද්ධති/ ඩීජේ සංගීතය සහ ශබ්ද විකාශන/ කෘමි පාලන සේවා/ ඉඩම් මැනීම්, ජංගම වැසිකිළි කුළියට ගැනීම් සහ කසළ ඉවත් කිරීම්, විදුලි/ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ/ රූපවාහිනී/ ශීතකරණ/ රෙදි සෝදන යන්ත්‍ර/ විදුලි පංකා ආදිය කුලියට ගැනීම්, සන්නිවේදන කට්ටල කුලියට ගැනීම් (වෝකි-ටෝකීස්), රූපවාහිනී/ ශීතකරණ / රෙදි සෝදන යන්ත්‍ර/ විදුලි පංකා ආදිය සවි කිරීම් සේවා/ සනීපාරක්ෂක හා විෂබීජ නාශක සේවාව.

X. ප්‍රචාරක නියෝජිත ආයතන, මාධ්‍ය ප්‍රචාරණ සැළසුම් කිරීමේ නියෝජිත ආයතන/ ඉසව් කළමනාකරණ (Event Management) නියෝජිතායතන, ඡායාරූප ශිල්පීන් සහ වීඩියෝ ශිල්පීන්/ පරිගණක ප්‍රකාශන සේවා (Desktop Publishing) BTL ප්‍රචාරණ සේවා/ LED සහ ඩිජිටල් තිර සැපයුම් කරුවන්/ රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන ආයතන/ දැන්වීම් සහ ක්‍රීඩා ඉසව් නිශ්පාදන ආයතන.

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා ක්‍රිකට්, නො.35, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07 | 0112691439**